www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉරානය හා මහජන මතය

**Iran and public opinion**

**2009 ජුනි 27**

ලෝක සමාජවාදී වෙබ් අඩවිය ට සැම සතියකම, උනුසුම් සහයෝගය මෙන්ම රුදුරු විරුද්ධත්වය ද පලකරන, පුලුල් පරාසයක ආකල්ප රැගත් ලිපි රාශියක් ලැබෙන අතර ඒ සියල්ලක්ම උනන්දුවෙන් කියවනු ලබයි. අපට ලැබෙන සමහර ලිපිවල පලවන්නේ සහයෝගය වේවා පසමිතුරුකම් වේවා, ඉන් හෙලිවන නිශ්චිත හා පුලුල්ව පදනම්වූ දේශපාලන හා සමාජ දැක්මක අත්‍යසාමාන්‍ය පැහැදිලිකම නිසා අපට විශේෂ වැදගත් කමක් උසුලයි.

"ඉරාන අර්බුදයේ ජාත්‍යන්තර ප්‍රශ්න" යන මැයෙන් ජුනි 25 දින ඉදිරිදර්ශන තීරුව පල කිරීමෙන් පසුව, ඉරාන වර්ධනයන් පිලිබඳව අප පලකරන අදහස් කෝපයෙන් යුතුව හෙලා දකින එවන් ලිපි දෙකක් එක් පුද්ගලයෙකු වෙතින් ලැබී තිබේ. ඔහු විරෝධය පල කරන්නේ, එම පීඩිත රටෙහි කටයුතුවලට එක්සත් ජනපදයේ දිගු කාලීන හා කුරිරු ඇඟිලි ගැසීම්වල සන්දර්භය තුල ඉරානයේ බල අරගලය පිරික්සා බලන එම ඉදිරිදර්ශනයට ය. මැතිවරනයෙන් පසුව ඇමරිකානු මාධ්‍ය විසින් මුදා හැර ඇති දැවැන්ත ප්‍රචාරක ව්‍යාපාරය පතුලෙහි පවතින නිශ්චිත ආසක්තයන් එහි දී අපි පැහැදිලි කර ඇත්තෙමු.

පලමු ලිපිය මෙසේ ප්‍රකාශ කරයි.

> නිදහසේ අදහස් පලකිරීමට ඇති අයිතිය වෙනුවෙන් වීදිවල මිය යන නිර්භීත ඉරාන වැසියන්ට ඔබ නිග්‍රහ කරයි. ඉරාන මැතිවරනයේ දූෂිත ස්වභාවයෙහි ඇඟවුම් ගැන දැන ගැනීමට ඔබට නිව් යෝර්ක් ටයිම්ස් පත්‍රය බැලීම අවශ්‍ය කෙරෙන්නේ නැත. ෆැසිස්ට්වාදයට එරෙහිව වීදිවල නැඟී සිටින මිනිසුන් දෙස බලන්න. හොඳ සිහියෙන් සිටින කිසිවෙකුත් අහමඩිනිජාඩ් තුනෙන් දෙකකින් ජයගත් බව විශ්වාස නොකරනු ඇත.
>
> වරෙක මා ඔබගේ වෙබ් අඩවිය දෙස බැලුවේ එය ආලෝකය විහිදුවන ප්‍රදීපස්ථම්භයක් ලෙස සලකාගෙන ය. එහෙත් දැන් ඔබ ඉරානයේ ෆැසිස්ට් ආඥාදායකයන්ට සහාය දක්වන කල මට පෙනී ඇත්තේ ඔබ, තමන්ගේ ම දෘෂ්ටිවාදාත්මක වාසිය තකා සත්‍යය විකෘති කිරීමට සූදානම්ව සිටින අන්ත දක්ෂිනාංශිකයන්ට නොදෙවෙනි, කෙතරම් වැරදි හා බොරුකාර කල්ලියක් ද යන වගයි.

එදිනම තරමක් පසුව ඔහු දෙවැනි ලිපියක් ද එවීය.

> ඔබගේ 'ඉදිරිදර්ශනය' ප්‍රකෝපකාරී ය. ඉරානයේ බලයෙහි සිටින ෆැසිස්ට්වාදීන් විසින් විරෝධතාකරුවන් විශාල සංඛ්‍යාවක් පිලිකුල් සහගත හා අමානුෂික ලෙස මරා දැමීම පිලිබඳව කිසිදු හෙලා දැකීමක් එහි අඩංගු නොවේ. අපට අසන්නට ලැබෙන්නේ එක්සත් ජනපද අධිරාජ්‍යවාදය පිලිබඳ එකම හා වෙහෙසකර අඥාන කථාවන් පමනි. මේ මොසාඩෙක් (1953 දී බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් විසින් කුමන්ත්‍රනයකින් බලයෙන් පහකර සිරගත කල එවකට සිටි ඉරාන අගමැති) නොවේ. මේ ෂා හෝ සදාම් හුසේන් ද නොවේ.
>
> මිනිසුන් ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් වීදිවල සටන් වැද මිය යන තැනකට ලෝකය පත්ව තිබෙන අතර ඔබ කාලයාගේ ඇවෑමෙන් විපරීතව ගොස් තවමත් පරන සටන් පාඨ හඬගාමින් සිටියි.

මෙම ලිපි තුල අන්තර්ගත දේශපාලනමය, බුද්ධිමය හා සමාජමය සාරය, ලෝක සමාජවාදී වෙබ් අඩවිය "එක්සත් ජනපද අධිරාජ්‍යවාදය පිලිබඳව අඥාන ලෙස කථා කිරීම" කෙරෙහි දක්වන එහි පසමිතුරු ආකල්පය තුලින් එලිමහනට ගෙන එයි. අපගේ කෝපාවිෂ්ඨ විවේචකයාට, ඉරානයේ වර්ධනයන්හි දී ඇමරිකානු අධිරාජ්‍යවාදයේ භූමිකාව නොවැදගත් සාධකයකි. එය වැදගත් වන්නේ "කාලයාගේ ඇවෑමෙන් විපරීතවූ" ආසක්තයන්හි ගැලී ගත් අයට පමනකි.

වෙනත් වචන වලින් කිවහොත් "අධිරාජ්‍යවාදය" අයත් වන්නේ අතීතයට ය. සමකාලීන සිදුවීම් සමාලෝචනය කිරීමේදී ඒ ගැන කථා කිරීමට හේතුවක් ඇත්තේ නැත. අපගේ විවේචකයා ඒ එසේ වන්නේ මන්ද යන්න ගැන කිසිවක් නොකියයි.

ඉරානයට මායිම්ව ඇති ඉරාකය, ඇෆ්ගනිස්ථානය හා පකිස්ථානය යන රටවල් තුනෙහි එක්සත් ජනපදය දැන් ගෙන යන යුද්ධය පිලිබඳ කාරනය නොවැදගත් ලෙස සලකා ඉවත දැමේ. එසේම මූලෝපායිකව වැදගත් පර්ෂියානු බොක්ක අරාගත් ඉරානයේ පිහිටීමත්, දැවැන්ත තෙල් හා ස්වාභාවික ගෑස් නිධි වලින් පොහොසත් වීමේ කාරනයත් නොවැදගත්ය. 1953 වසරේ සීඅයිඒ සංවිධානයේ පිටුබලය සහිතව මොසාඩෙක් තන්ත්‍රයට එරෙහිව සිදුවූ කුමන්ත්‍රනයත්, ඉන්පසු 25 වසරක මිලිටරි ආඥාදායකත්වය පිලිබඳව ලෝසවෙඅ කරන සැඳහුමත් අනදාල "මොට්ට" කථාවක් යයි අප සිතාගත යුතු ය. එසේ වුවත්, මිලියන ගනන් ඉරාන වැසියන්ගේ සිත් තුල ෂාගේ පාලනය පිලිබඳ මතකය ගැඹුරින්ම මුල් බැස පවත්නේ යයි අපි විශ්වාස කරන්නෙමු.

ඉරානයේ විරුද්ධ පාක්ෂික "ප්‍රජාතන්ත්‍රවාදී" ව්‍යාපාරයට සහයෝගය පල කරමින් එක්සත් ජනපද හා බටහිර මාධ්‍ය විසින් ගෙන යන ප්‍රචාරක ව්‍යාපාරය කෙරෙහි ලිබරල් හා මධ්‍යම පන්තික "වම්මුන්ගේ" පුලුල් ස්ථරයන් තුලින් දැක්වෙන ප්‍රතිචාරය ලිපි වලින් පිලිබිඹු කෙරේ. එක්සත් ජනපදයේ පිටුබලය ලත් මේ පැයෙහි වීරයන් ඉදිරිපත් කරන ක්‍රියාමාර්ගය හා ඔවුන්ගේ ආයාචන යොමුවී ඇති සමාජ බලවේග ගැන කෙසේ වෙතත් ඔවුන්ගේ දේශපාලන පැටිකිරිය විභාග කිරීම නියත වශයෙන්ම අපගේ විවේචකයා විසින් නොතකා හැර තිබේ. එය ද "මොට්ට කමක්" විය යුතුය.

අපගේ විවේචකයා "ෆැසිස්ට්වාදය" ගැන සඳහන් කරයි. එහෙත් එය පදනම්ව ඇති සමාජ බලවේගයන් පිලිබඳව මොනම විශ්ලේෂනයක් කෙසේවත් ඉදිරිපත් කිරීමට ඔහු සමත්වී නැත. මෙය නොවැදගත් මගහැරීමක් විය නොහැකිය. අවම වශයෙන් මාක්ස්වාදී සම්ප්‍රදායට අනුව ෆැසිස්ට්වාදය හඳුනාගෙන ඇත්තේ මධ්‍යම පන්තික ව්‍යාපාරයක් ලෙසය. ධනේශ්වර (අපට මේ යෙදුම භාවිතා කිරීමට අවසර ඇත් ද?) මාධ්‍ය තුල සිටින අහමඩිනිජාඩ්ගේ බද්ධ වෛරක්කාරයින් පවා, ආන්ඩු විරෝධී බලවේග සිය මහජන සහයෝගය දිනාගෙන ඇත්තේ නාගරික මධ්‍යම පන්තිය වෙතින් බව ප්‍රතික්ෂේප නොකරති. විශේෂයෙන්ම ආන්ඩුවේ ජනතාවාදී ආර්ථික පිලිවෙත්වලට සතුරු ස්ථරයන් අතුරිනි.

අහමඩිනිජාඩ්ට එරෙහි විරෝධතා "ෆැසිස්ට්වාදී" යයි මෙයින් අදහස් නොකෙරේ. විෂමාකාර සමාජ ව්‍යාපාරයන්ට හිතේ හැටියට ලේබල් ගැසීමේදී යමෙක් ප්‍රවේශම් විය යුතුය. ප්‍රජාතන්ත්‍ර විරෝධී ඉස්ලාමීය තන්ත්‍රයට අවංකව ම විරුද්ධ කොටස් ද විරෝධතාවන් තුල දැකිය හැකිය. එහෙත් ඔවුන් දේශපාලනිකව ව්‍යාකුල හා කම්කරු පන්තිය වෙත යොමුවූවන් නොවේ. ඔවුන්ගේ අවංක කම සමාජවාදී ක්‍රියාමාර්ගයකට ආදේශකයක් ද නොවේ. තව ද, එවන් කොටස් විරෝධතා පෙලපාලිවලට උත්තේජනයක් ද වී නැත.

අපගේ විවේචකයා කියා සිටින්නේ පෙලපාලිකරුවන් "ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් වීදිවල සටන්වැදී මිය යන" බවයි. මෙම බලවේග හෝ වඩාත් නිශ්චිතව කිවහොත්, පෙලපාලි සංවිධානය කරනු ලැබූ පාලක ඉස්ලාමීය සංස්ථාපිතයේ කොටස්, ඒවායේ මුල් තැන ගැනීමට සමත් වුවහොත් කුමක් කරනු ඇත් දැයි සලකා බැලීමට ද ඔහු අසමත් වෙයි. මවුසාවිගේ කන්ඩායමට බලය මාරු කිරීමේ ප්‍රතිපලය, සීඅයිඒ සංවිධානය විසින් පිටුබලය දී, ඇමරිකානු මාධ්‍ය මඟින් ප්‍රචලිත කල අනෙකුත් "පැහැගත්" විප්ලවයන්හි ප්‍රතිපල වලින් අති මූලිකව වෙනස්වනු ඇත්තේ මන් ද යන්න ඔහු පැහැදිලි කරන්නේ නැත. නිදසුනක් ලෙස ජෝර්ජියාවේ ප්‍රජාතන්ත්‍රවාදය අවුස්සාගෙන බලයට පත් සකාෂ්විලී තන්ත්‍රය, මෑතකදී රුසියාවට එරෙහිව එක්සත් ජනපදයේ මුදල් වලින් සිදුකල යුද්ධයේ බලල් අත ලෙස කටයුතු කල අතර, දැන් මහජන විරෝධතා මඩිමින් සිටියි.

ඉරානයේ දිගහැරෙමින් ඇති සිදුවීම් තුල අධිරාජ්‍යවාදයේ ආසක්තයන්, ක්‍රියාකලාපයක් ඉටුකරන්නේ නැතැයි අපගේ පාඨකයා අවධාරනය කරයි. එහෙත් පසුගිය 20 දින *නිව් යෝර්ක් ටයිම්ස්* පත්‍රයේ පලවූ ලිපියක් දෙස බලන්නේ නම් ඔහු යමක් ඉගෙනගනු ඇත. "තෙල් කොන්ත්‍රාත්තු මත ප්‍රවේශමෙන් ඉදිරියට ඇදෙයි" යන සිරස්තලය යටතේ *ටයිම්ස්* වාර්තාකරු බැග්ඩැඩයේ සිට මෙසේ ලියයි. "22 දින ඉරාකය තමන් සතු විශාලතම තෙල් බිම් සමහරක සංවර්ධනය කිරීමේ අයිතිය විදේශීය සමාගම් වලට වෙන්දේසියේ දමන කල, ලංසු තැබීම දිය බෙත්මක අවස්ථාවක් වනු ඇත. මන්ද යත් වසර 40 කට පමන පෙර පයින් ගසා දොට්ට දමනු ලැබූ එක්සොන් මොබිල් වැනි තෙල් යෝධයන් එරටෙහි සම්පත් අතට ගැනීම සඳහා පලමු අවස්ථාව හිමිකර ගන්නා බැවින්ය."

වාර්තාව, *ටයිම්ස්* වෙත පල කල එක්සොන් මොබිල් හි හිටපු අධ්‍යක්ෂ ඩැනියෙල් නෙල්සන් ගේ ප්‍රකාශයක් උපුටා දක්වයි. "ඉරාකය දෙවියන් දුන් අනර්ග ස්වාභාවික සම්පත්වල ආශීර්වාදය ලබා ඇති බව දන්නා ලෝකයේ ඇති සෑම ජාත්‍යන්තර තෙල් සමාගමක්ම ඉරාකයට වහ වැටෙනු ඇති බව මගේ විශ්වාසයයි."

සීඅයිඒ පිටුබලය ලබන ඉරානයේ කන්ඩායම් ජයග්‍රහනය ලැබීමෙන් පසුව වසරක් හෝ දෙකක් ගිය තැන ඒ හා සමාන වාර්තා එරටින් ද ගලා එනු ඇතැයි සිතාගැනීම එතරම් ම දුෂ්කර ද?

අපගේ විචේචකයාගේ ලිපිය කෙරෙහි අවධානය යොමු කරන ලෙස අප කියා සිටින්නේ එය ඉරාන අර්බුදය කෙරෙහි සැලකිය යුතු දේශපාලන ප්‍රතිචාරයක් නියෝජනය කරන බැවින්ය. මහජන මතයේ "හදිසි" මාරුවක් සේ පෙනී යන අවස්ථාවක් ලෙස අර්බුදයක් සේවය කිරීම නිතරම පාහේ සිදුව තිබෙන දෙයකි. කෙසේ වෙතත් "හදිසි" මාරුව දිග් ගැස්සුනු කාලපරිච්ඡේදයක් තිස්සේ වර්ධනයවී ආ දේශපාලන ක්‍රියාවලීන්ගේ නිමැවුමක් බව වැඩි කල් යාමට මත්තෙන් පැහැදිලි වනු ඇත.

ඉරාන අර්බුදයේ වඩාත් කැපී පෙනෙන ලක්ෂනයක් වන්නේ, බෙහෝ "ප්‍රගතිශීලී" හා "වාම" ප්‍රකාශන හා සංවිධාන, එක්සත් ජනපදයේ හා යුරෝපයේ මාධ්‍ය උද්ඝෝෂනය සමඟ නිර්ලජ්ජිත ලෙස සහයෝගීතාවකට පැමින තිබීමයි. එක්සත් ජනපදයේදී අවස්ථාවාදී "වාම" කන්ඩායම් සමඟ නේෂන් සඟරාවේ ස්වකීයමය ප්‍රගතිශීලීත්වය, ඉරානයේ "පැහැගත් විප්ලවයට" සහාය පිනිස ඔබාමා පරිපාලනය හා ඇමරිකානු මාධ්‍ය පිටුපස පෙලගැසී සිටිති. බ්‍රිතාන්‍යයේදී සමාජවාදී කම්කරු පක්ෂය ද එයම කරයි. ප්‍රන්සයේ ඔලිවර් බෙසැන්සිනෝගේ නව ධනේශ්වර විරෝධී පක්ෂය ඉරානයේ පූජක තන්ත්‍රය පෙරලා දැමීමට අවශ්‍ය "සියල්ලන්ට" තම සහයෝගය ලැබෙන බව ප්‍රකාශ කර ඇති අතර සාකෝසි ආන්ඩුවේ ආධාරකරුවන් සමඟ එක පෙලට පෙලපාලියක යාමට ලකලෑස්ති වෙමින් සිටියි.

ජර්මනියේදී හරිත පක්ෂය මවුසාවි හා රෆ්සන්ජානි විසින් නායකත්වය දෙන ඉරානයේ විපාර්ශවය වැලඳගෙන සිටින අතරම ඇන්ජිලා මර්කෙල්ගේ දක්ෂිනාංශික ක්‍රිස්තියානි ඩිමොක්‍රටික් සංගමය සමඟ හවුලකට යාමට පවා සූදානමින් සිටියි.

සැබවින්ම අපගේ විචේචකයා වර්ධනයන් පිලිබඳව සිත් යොමු කරන කල ඔහුගේ ආස්ථානය ගැන යලි සලකා බලනු ඇතැයි අපි උදක්ම බලාපොරොත්තු වන අතර එය සිදුවිය හැක්කකි. එහෙත් මෙම පුද්ගලයාගෙන් සපුරාම වෙන්කොට ගත හොත්, හිටපු ලිබරල් වම්මුන්ගෙන් සැලකිය යුතු කොටසක් තියුනු ලෙස දකුනට මාරුවී තිබීමත්, ඉරාන අර්බුදය පැරනි දේශපාලන වගකීම් සෝෂාකාරී ලෙස අතහැර දැමීම සඳහා අවස්ථාවක් සපයා තිබීම පිලිබඳවත්, කිසිදු සැකයක් ඇත්තේ නැත. මෙම සංසිද්ධියේ මුල් වැටී ඇත්තේ සැබෑ සමාජ ක්‍රියාවලීන් තුලය. ඒවා සෑම ප්‍රධාන ධනේශ්වර රටකම පන්ති සම්බන්ධතාවන්ගේ ආන්තික ධ්‍රැවාන්තගත වීමකට අදාලය. මෙම ධ්‍රැවාන්තගතවීම ගෝලීය ආර්ථික අර්බුදය මඟින් තව දුරටත් තීව්‍ර කෙරේ.

දශක ගනනාවක කාල පරිච්ඡේදයක් පුරා ප්‍රතිසංස්කරනවාදී, ලිබරල් හා "රැඩිකල්" සංවිධානවල පවා අධිකාරය දරන ලද මධ්‍යම පන්තික ස්ථරයන්, සිය ආර්ථික හා සමාජ තත්ත්වයේ වැඩි දියුනුවක් අත්දැක තිබේ. ඔවුන්ගේ ම මැසිවිලිවලට විසඳුම් ලැබී ඇති තාක් දුරට ඔවුන් සෑහීමට හා සතුටට පත්කර තිබේ.

ඔවුන්ගේ දේශපාලන දැක්ම, අනන්‍යතා හා "ජීවන රටා" දේශපාලනය යයි කිව හැකි තත්ත්වයන් මඟින් අධිකාරවත් වී තිබේ. මධ්‍යම පන්තික මහජන මතය, හොඳ ඇඳුම් ආයිත්තම්වලින් සැරසුනු ටෙහෙරානයේ ගැහැනුන් හා පිරිමින්ගේ විරෝධතා වෙත මෙතරම් පහසුවෙන් ඇදී ගියේ මන්ද යන්නට එක් හේතුවක් මෙයයි. ඔවුන්ගේ සමාජ ආකල්පයන් අඩු වශයෙන් මතුපිටින් වත්, තමන්ගේම තත්ත්වයන්ට වඩාත් සමීපව පවත්නේය. මධ්‍යම පන්තියේ ධනවත් කොටස්වල සමාජ ආත්මාර්ථකාමීත්වය සැලකිය යුතු මට්ටමකින් වැඩී යාම සිදුවී ඇත්තේ, කම්කරු පන්තියෙහි ජීවන තත්ත්වයන් හා සමාජ කොන්දේසි තියුනු පරිහානියකට ලක්ව තිබියදී ය.

කාලයාගේ ඇවෑමෙන් මෙම ස්ථරයන් කම්කරු පන්තියෙන් වඩ වඩාත් හුදෙකලා හා පරත්වාරෝපිත තත්ත්වයකට, විවෘත සතුරුකමේ තැනකට ම වැඩී ගොස් තිබේ. මෙය "වාම" මාධ්‍යයේ විවිධ ප්‍රකාශන තුල පිලිබිඹු වෙයි. ඉරානයේ "පසුගාමී" හා "භක්තිමත්" කම්කරුවන්, විපාර්ශවයේ සමාජ පදනම සකසා තිබෙන, උගත් හා ආර්ථික වශයෙන් දියුනු වෘත්තිකයන්, ව්‍යාපාරිකයන් හා සිසුන්ගේ කොටස් සමඟ විෂමාකාර ලෙස සන්සන්දනය කෙරෙයි.

මෙයින් ඇඟවුම් කෙරෙන්නේ කුමක් ද? අධිරාජ්‍යවාදය කෙරෙහි විරුද්ධත්වය දැන් වඩාත් සෘජු ලෙස හා විවෘතව, මෙම ග්‍රහලෝකය තුල සිටින එකම ස්ථිරසාර විප්ලවවාදී බලවේගය වන ජාත්‍යන්තර කම්කරු පන්තිය වෙතට මාරුවී තිබෙන බවයි. ඉරානයේ ද ජාත්‍යන්තරව ද අති මූලික දේශපාලන කර්තව්‍ය වන්නේ කම්කරු පන්තියේ ස්වාධීන විප්ලවවාදී සමාජවාදී ව්‍යාපාරයක් ගොඩනැඟීමයි.

ලිබරල් හා හිටපු රැඩිකල් "වමේ" බිඳවැටීම වනාහි, කම්කරු පන්තියේ යලි ඉස්මතුවීම පිලිබඳවත්, ලෝක පරිමාන පන්ති ගැටුමේ නව අවධියක් ළඟාවෙන බවටත් නොවරදින පෙර නිමිත්තකි.

**බැරී ග්‍රේ හා ඩේවිඩ් නෝර්ත් විසිනි**

© www.wsws.org